# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
📠 011 286 4051

මගේ අංකය / எனது இல / My No.
ඔබේ අංකය / உமது இல / Your No
දිනය / திகதி / Date } 2020.09. 28

උපදෙස් පත්‍රිකා අංක -2020/3

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,
සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු,
ඉඩම් කොමසාරිස්වරු/සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්),

<u>රජයේ ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් සමඟ 2020.09.24 දින පැවති සාකච්ඡාව හා බැඳේ.

02. ඒ අනුව එම සාකච්ඡාවේදී ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා උපදෙස් දුන් පරිදි රජයේ ඉඩම්වල දීර්ඝකාලයක සිට පදිංචි/ සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත සුදුසුකම් පරීක්ෂා කර බලා නීත්‍යානුකූල ලේඛන ලබා දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/04 හා 2008/04 (1) චක්‍රලේඛයේ උපදෙස් පරිදි අදාළ කටයුතු කඩිනමින් මාස 06ක් තුළ සිදු කර අවසන් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා මෙයින් උපදෙස් දෙමි.

03. උක්ත චක්‍රලේඛ මගින් දැනටමත් හඳුන්වා දී ඇති ක්‍රමවේද අනුගමනය කරමින් ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී බැහැර කිරීමට හැකියාවක් ඇති බවට හඳුනාගත් ඉඩම් සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සෑම ඉල්ලීමකටම අදාළව ඉඩම් කච්චේරි පවත්වා අවසන් කළ යුතුය. මෙහිදී ප්‍රාදේශීය/ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ සහභාගීත්වයක් අවශ්‍ය බව හැඟී යන්නේ නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර ගත යුතුවේ. ඉඩම් කච්චේරි පවත්වන අවස්ථාවේ දී වුවද, ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් එම ඉල්ලීම ද සලකා බලා පසුව ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකර අදාළ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතුය.

04. ඉදිරිපත් වී ඇති සෑම ඉල්ලීමකටම අදාළව කටයුතු සිදු කිරීම 2021.03.31 දිනට පෙර සිදුකර අවසන් කළ යුතු බැවින් පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ගේ සම්බන්ධීකරණය යටතේ සෑම ග්‍රාම නිලධාරී වසමකටම අදාළව නිශ්චිත කාල සීමාවක් තුළ සිදුකර අවසන් කළ යුතුය.

පාලන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 📠 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 📠 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 📠 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 📠 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 748 📠 011 288 363
E-mail - landcom@landcommdept.gov.lk    Web Address - www.landcommdept.gov.lk